**පලාගල ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයා වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට පලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු හා මිලදීගෙන තිබුණු පුස්තකාල පොත්වල එකතු වටිනාකම රු.133,381 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශන වල එය රු.260,853 ක් ලෙස දක්වා තිබිම හේතුවෙන් ස්ථාවර වත්කම් රු.127,472 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල විශ්‍රාම වැටුප් දායකය රු.14,197 ක් වූ නමුත් අවස්ථා 02 ක දී ගෙවා තිබුණු රු.50,000 ක මුදල වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වියදම රු.35,803 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.382,059 ක් වූ ගෙවිය යුතු විශ්‍රාම වැටුප් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සභාව සතු දේපල ස්ථාන 03 කින් ලැබිය යුතු බදු ආදයම රු.1,375,001 ක්වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,410,084 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම් රු.35,083 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) | 134. 1 වගන්තිය | බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන දේපලවල වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු පැනවීමට හා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පනවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | 177 වගන්තිය | සභාවේ සේවය කරන තාවකාලික, අනියම් සේවකයන්ගේ සේවය අවසන්කල විට ඔවුන්ට පාරිතෝෂික ගෙවීම් සඳහා වූ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| | රීති 5.11 | සභාව සතු මාර්ගස්ථ මුදල් සහ වෙනත් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් නිසි ආකාරයක රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 අංක දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව භාවිතා කරන පරිගණක හා මෘදුකාංග පිළිබඳව ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2 මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,446,979 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,090,399 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම හා රැස්කල ආදායම

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ජනවාරි දිනට 01 ආරම්භක ශේෂය | 2017 වර්ෂයේ බිල්කල ආදායම | 2017 රැස්කළ ආදායම 2017.01.01 දිනට හිඟයෙන් | 2017 රැස්කළ ආදායම 2017 බිල්කල ආදායමින් | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම |
|---|---|---|---|---|---|
| | වටිනාකම | වටිනාකම | වටිනාකම | වටිනාකම | වටිනාකම |
| | රු. | රු. | රු. | රු. | රු. |
| උසාවි දඩ | 6,937,024 | 7,996,468 | 1,309,406 | - | 13,624,086 |
| මුද්දර ගාස්තු | 1,742,530 | 634,600 | - | - | 2,377,130 |
| ව්‍යාපාර බදු | - | 1,037,230 | - | 1,037,230 | - |
| දැන්වීම් පුවරු ගාස්තු | - | 60,095 | - | 16,170 | 43,925 |
| කසල ශෝධක බදු | - | 98,100 | - | 98,100 | - |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | - | 100,008 | - | 100,008 | - |
| වෙළඳසැල් සහ කඩ | - | 33,000 | - | 33,000 | - |
| ටෙන්ඩර් මත කුලී | - | 1,410,085 | - | 1,410,085 | - |
| මෝටර් ග්‍රේඩර් කුලී | - | 963,500 | - | 818,550 | 144,950 |
| එකතුව | 8,679,554 | 12,333,086 | 1,309,406 | 3,513,143 | 16,190,091 |

2.2.2 වෙනත් ආදායම්

------------------

සභාවේ මෝටර් ග්‍රේඩරය කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ශේෂය රු.144,950 ක් විය.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

2017 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.13,624,086 ක් හා මුද්දර ගාස්තු රු.2,377,130 ක් ලැබිය යුතුව තිබුණු අතර එයින් 2018 අගෝස්තු 31 වන විට උසාවි දඩ රු.7,150,000 ක් පමණක් ලැබී තිබුණු බැවින් තවදුරටත් උසාවි දඩ රු.6,479,086 ක් හා මුද්දර ගාස්තු රු.2,377,130 ක් ලබාගත යුතුව පැවතුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා පොදු මංමාවත් පිළිබඳව පාලනය විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත් උතුරු මැද පළාත් සභාව මගින් අතුරු ව්‍යවස්ථා 10 ක් වැළඳගත් බව 2017 නොවැම්බර් 30 වන දින අංක 2048 දරන ගැසට් පත්‍රය මගින් පලකර තිබුණි. නමුත් අදාල අතුරු ව්‍යවස්ථාවේ උපදෙස් ප්‍රකාර එම කර්තව්‍යයන් ක්‍රියාත්මක කර නොකිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් හඳුනාගෙන ඒවා ඇතුළත් වන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

----------------------------------------

පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2016 ජූනි 22 දිනැති ලිපියෙන් ආඩියාගල පැරණි කාර්යාලයේ ඇති ආයුර්වේද මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම සඳහා රු.500,000 ක ප්‍රතිපාදන අනුමත වි තිබුණු නමුත් එම ප්‍රතිපාදන උපයෝගි කරගෙන සභා කාර්යාල භූමියේ පිහිටි පුස්තකාල ගොඩනැගිල්ලේ ඉදිරිපස කොටසෙහි ෆිනිෂින් වහලක් සවිකර තිබුණි.

(ඈ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

------------------------------------------------

ඇස්තමේන්තු වටිනාකම රු.9,413,870 ක් වූ ව්‍යාපෘති 02 ක් ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,311,230 ක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටමට ලඟා වී නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

සභාව විසින් බල ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබූ අතර මාසිකව එකතු වන ටොන් 15 ක පමණ කසළ බල ප්‍රදේශයේ ස්ථාන දෙකකට අවිධිමත් පරිදි බැහැර කර තිබුණි.

(ඉ) පාරිසරික ගැටළු

-------------------

දිරන හා දිරාපත් නොවන අපද්‍රව්‍ය පරිසරයට බැහැර කිරීම නිසා පාරිසරික ගැටළු මෙන්ම ඒවා දහනය කිරීමෙන් වායුගෝලයටද විශාල හානියක් සිදුවන බව නිරීක්ෂණය විය.

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

2012 වර්ෂයේ මිලදී ගත් සභාව සතු අත්ට්‍රැක්ටරයක් ලියාපදිංචියකින් තොරව ධාවනයේ යොදවා තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

සේවක පුරප්පාඩු හා අතිරික්ත

---------------------------------

සභාවට අනුමත සමස්ථ සේවක සංඛ්‍යාව 35 ක් වුවත් 2017 දෙසැම්බර් 31 දින වනවිට අනියම් සේවකයන්ද ඇතුළත්ව සේවකයින් 38 දෙනෙක් සේවයේ යොදවා තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

----------------------------

3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව වටිනාකම හඳුනා නොගත් වත්කම් විෂයන් 09 ක් වත්කම් ලේඛනයකට ඇතුළත් කර නොතිබුණි.

3.4.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

---------------------------------------------

බුදුගේහින්න කඩකාමර 05 ක් සහිත අක්කරයක් පමණ වූ භූමි ප්‍රමාණය, ප්‍රදේශවාසීන් විසින් අත්පත්කර ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් එහි අයිතිය සභාවට අහිමි වීමේ අවදානමක් පැවතුණි.

3.4.3 පවරා නොගත් වත්කම්

-------------------------

පහත කරුණු නිරීක්ෂණයන් විය.

(අ) සභා බල ප්‍රදේශයට අයත් වපසරිය අක්කර 34.75 ක් වූ සුසාන භූමි 38 ක අයිතිය සභාවට පවරාගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් නඩත්තු කරනු ලබන හෝ ඉදිකිරීම් කර ඇති අක්කර 17.5 ක්වූ ඉඩම් කැබැලි 14 ක් හා ප්‍රමාණය සඳහන් නොවූ තවත් ඉඩමක අයිතිය 2018 මාර්තු 31 දින වන විටත් සභාවට පවරාගෙන නොතිබුණි.

3.4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ආඩියාගල සහ පුබ්බෝගම නැණසල මධ්‍යස්ථානවල ඇති පරිගණක හා පරිගණක උපාංග විෂයයන් 67 ක වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොතිබුණි. 2014 වර්ෂයේ සිට පරිගණක පාඨමාලා පැවත්වීමට සුදුසුකම් ඇති නිලධාරියෙකු නැණසල මධ්‍යස්ථානවලට පත් කර නොතිබීම නිසා එහි ඇති වත්කම් නිෂ්ක්‍රීයව පැවතුණ අතර සමහර උපකරණ 2018 අගෝස්තු 31 දින වනවිට භාවිතයට ගත නොහැකි තත්වයට අක්‍රීය වී තිබුණි.

3.5 හඳුනාගත් පාඩු

2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වී තිබු පුස්තකාල දෙකක රු.22,170 ක් වටිනා පොත් 85 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.6 ප්‍රසම්පාදනය

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

නිසි පුරෝකථනයකින් තොරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයන් 05 ක අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර සියයට 43 ක සිට සියයට 519 දක්වා වූ පරාසයක විචලනයක්ද වියදම් විෂයන් 07 ක අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 34 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයක්ද නිරීක්ෂණය විය.

4.2 පිළිතුරු නොලත් විගණන විමසුම්

2018 ජනවාරි 08 දින සභාවට නිකුත් කර තිබුණු විගණන විමසුමක් සඳහා 2018 ජුනි 08 දින වන විටත් පිළිතුරු ලබාදී නොතිබුණි.

5 පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ආදායම් කළමනාකරණය | (i) | සංවර්ධිත කලාප නම්කර වරිපනම් අය නොකිරීම. |
| | | (ii) | හිගහිටි ආදායම් අයකර නොගැනීම. |
| (ආ) | ස්ථාවර වත්කම් | (i) | නිසි පරිදි අගය නොකිරීම |
| | | (ii) | අයිතිය තහවුරු කර නොගැනීම |
| (ඇ) | අභ්‍යන්තර පාලනය | (i) | අභ්‍යන්තර විගණනය සිදුකර වාර්තා ඉදිරිපත් නොකිරීම |
| | | (ii) | විගණන හා කළමණාකරන කමිටු නොපැවැත්වීම. |
| (ඇ) | ණයගැති හා ණයහිමි | (i) | උපලේඛන පිලියෙළ නොකිරීම. |
| | | (ii) | කාල විශ්ලේෂණ පිලියෙළ නොකිරීම. |
| (ඇ) | සැලසුම් කිරීම | | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මක් හා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් නොකිරීම. |